# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2184/12 - 2020 ජූලි මස 14 වැනි අඟහරුවාදා - 2020.07.14**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි අධිකාරිය)**

*මගේ අංකය*: 4-3/1 (පත්කිරීම් - අත්කර ගැනීම්).

ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ ගරු ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා විසින් මහකොළඹ ගංවතුර පාලනය කිරීමේ හා පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය, කොළඹ අගනගර ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘතිය, වේරැස් ගඟ වැසි ජලය අපවහනය හා පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සහ කොළොන්නාව වැසි ජලය අපවහනය හා පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යන ව්‍යාපෘතීන්හි ඉඩම් අත්කර ගැනීමේ කටයුතු කඩිනම් කිරීම පිණිස පහත නම් සඳහන් නිලධාරියා අදාළ ප්‍රාදේශීය ලේකම්ගේ විධානය පිට ක්‍රියා කරන ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි ලෙස පත් කර ඇත.

**උපලේඛනය**

| *නිලධාරියාගේ නම* | *පත්කළ බල ප්‍රදේශය* | *පත් කළ යුතු කාලසීමාව* |
|---|---|---|
| එච්. තිලකවර්ධන මහතා (ශ්‍රී ලංකා පරිපාලන සේවය 1 වන පන්තියේ විශ්‍රාමික නිලධාරි) | ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, කොළඹ, කඩුවෙල, කොළොන්නාව, දෙහිවල, රත්මලාන, මහරගම, කැස්බෑව, මොරටුව, තිඹිරිගස්යාය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සඳහා | 2020.08.01 දින සිට වසර දෙකක් සඳහා. |

**ආර්. ඒ. ඒ. කේ. රණවක,**
ලේකම්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය.

2020 ජූලි මස 14 වැනි දින,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
''මිහිකත මැදුර''
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

07 - 758


G 32484 - 27 (2020/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.


මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.